10878

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2018
**Year End Evaluation**

| ශ්‍රේණිය / தரம் / Grade | විෂයය / பாடம் / Subject | පත්‍රය / வினாத்தாள் / Paper | කාලය / காலம் / Time |
|---|---|---|---|
| 06 | කතෝලික ධර්මය | I ,II | පැය 02යි. |

නම:-............................................................ විභාග අංකය:-..................................................

සැලකිය යුතුයි. :-
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

## I කොටස

නිවැරදි හෝ ඉතාමත් ගැළපෙන පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. ශුද්ධ බයිබලයේ ඇති ක්‍රිස්තුස් වහන්සේ පිළිබඳ කරුණු ඇතුළත් ප්‍රධාන මූලාශ්‍ර හතර හඳුන්වන නම වන්නේ,
   1. පාවුලු තුමාගේ හසුන් ය.
   2. පංච පුස්තකය යි.
   3. ශුභාරංචි ය.
   4. දිවැසි ග්‍රන්ථ ය.

02. ශුද්ධ බයිබලයේ ඇතුළත් දෙවන පොත වන්නේ,
   1. උත්පත්ති පොත ය.
   2. ලෙවී ව්‍යවස්ථාව ය.
   3. නික්මයාම පොත ය.
   4. ගණන් කතාව ය.

03. දෙවියන් වහන්සේ මැවූ මිනිසාට සියලු සත්වයන් කෙරෙහි බලය ඇති බවත් අන් මැවිලිවලට වඩා උතුම් බවත් දක්වෙන පිළිතුර වනුයේ,
   1. මිනිසා ශක්ති සම්පන්න නිසා ය.
   2. මිනිසාව හය වන දින මැවූ නිසා ය.
   3. මැවිල්ලේ සෑම සතෙකුට ම නම් තැබූ නිසා ය.
   4. මිනිසාගේ අකීකරුකම ය.

04. "මරියාවෙනි බිය නොවන්න. ඔබ දෙවියන් වහන්සේගේ වරප්‍රසාද ලද්දෙහිය" මෙලෙස ප්‍රකාශ කරන ලද්දේ,
   1. ජුසේ තුමා ය.
   2. ගාබ්‍රියෙල් දේව දූතයා ය.
   3. රෆායෙල් දේවදූතයා ය.
   4. එඩේරුන් ය.

05.

දේව ප්‍රසාද නිධාන

ආරම්භක දේව ප්‍රසාද නිධාන | සමාජීය දේව ප්‍රසාද නිධාන | ..........................................

ඉහත හිස්තැනට අදාළ පිළිතුර වන්නේ,

1. සුවදානයේ ප්‍රසාද නිධාන
2. කිතුනු ප්‍රසාද නිධාන
3. අධ්‍යාත්මික ප්‍රසාද නිධාන
4. ශාරීරික දේව ප්‍රසාද නිධාන

06. ● වේදනාව දරා ගැනීමේ ශක්තිය

● පව් කමාව

● ශාරීරික සුවය

● ක්‍රිස්තුස් වහන්සේගේ දුක්ප්‍රාප්තියේ කොටස්කරුවෙකුවීම

ඉහත කරුණුවලට අදාළ පිළිතුර වන්නේ

1. සමගි සන්ධානයේ ප්‍රසාද නිධානයේ වරප්‍රසාදයන් ය.
2. රෝගීන් ආලේපය ප්‍රසාද නිධානයේ වරප්‍රසාදයන් ය.
3. කිතුනු ජීවිතයේ අත්දැකීම් ය.
4. දේව ප්‍රසාද නිධානවලින් ලැබෙන දීමනා ය.

07. ආත්මය තුළ නොමැකෙන ලාංඡනයක් සනිටුහන් වන ප්‍රසාද නිධානයක් වන්නේ,

1. දිව්‍ය සත්ප්‍රසාදය
2. පාපොච්චාරණය
3. රෝගීන්ගේ ආලේපය
4. පූජකවරය

08. දේව ප්‍රේමය පදනම් කර ගනිමින් අසල්වැසියාට ප්‍රේම කිරීම

1. කිතුනු දහමේ මූලික ඉගැන්වීමයි.
2. මිනිසාගේ කැඳවීමයි.
3. දේව වරප්‍රසාදයයි.
4. මිනිස් ක්‍රියාවලියයි.

09. දේව පනත් පිළිබඳව සඳහන් ශුද්ධ ලියවිල්ලේ ඇති තවත් ග්‍රන්ථයක් වන්නේ,

1. උත්පත්ති පොත
2. ක්‍රියා පොත
3. එළිදරව් පොත
4. ද්විතීය නීති සංග්‍රහය

10. ක්‍රිස්තුන් වහන්සේගේ දුක් විදීම, මරණය හා උත්ථානය යනුවෙන් අර්ථ දක්වෙන්නේ,

1. දේව ප්‍රසාද නිධානයයි.
2. දස පනතයි.
3. දිව්‍ය පූජාවයි.
4. පාස්කු අභිරහසයි.

11. තමාගේ මෙන්ම අන් අයගේද ජීවිත රැක ගැනීම සඳහා අපව කැඳවන දේව පනත වන්නේ,

1. 4 වන දේව පනත ය.
2. 5 වන දේව පනත ය.
3. 3 වන දේව පනත ය.
4. 8 වන දේව පනත ය.

12. ජේසුස් වහන්සේ කතා කොට "පියාණෙනි, ඔවුන්ට කමා වුව මැනව. ඔවුන් කරන දෙය ඔව්හු නොදනිති."
මෙම ප්‍රකාශයේ ඔවුන් යනුවෙන් අදහස් වන්නේ,

1. ගෝලයන්ව ය.
2. ජේසුස් වහන්සේ සමග සිටි අයව ය.
3. ජේසුස් වහන්සේව මරණයට පත්කළ අයව ය.
4. පාපී ක්‍රියා කළ අයව ය.

13. A වසරකට වරක් පාපොච්චාරණය කිරීම
B දිනපතා යාච්ඤා කිරීම
C සභාවේ නඩත්තුවට ආධාර දීම
D මව්පියන්ට සංග්‍රහ කිරීම

ඉහත දී ඇති ශුද්ධ වූ සභාවේ ශික්ෂා පද පමණක් ඇති පිළිතුර වන්නේ,

1. A, B 2. C, D 3. A, D 4. A, C

14. "දෙවියන් වහන්ස පව්කාර වූ මා හට කරුණා කළ මැනව කියා යාච්ඤා කළේ,

1. අයකැමියා ය. 2. පරිසිවරයා ය.
3. පිලාත් ය. 4. ජාකොබ් තුමා ය.

15. පෙර දින රාත්‍රියේ සියලු නපුරෙන් ජීවිත සුරැකීම ගැන දෙවි පියාට තුති පුදන යැදුම වන්නේ,

1. උදය ආරාධනාව
2. රාත්‍රී ආරාධනාව
3. නමෝ මරිය යාච්ඤාව
4. ස්වාමි වාක් ආරාධනාව

16. "ඔබ යාච්ඤා කරන කළ මෙසේ කියන්න." යැයි පවසමින් ජේසුස් වහන්සේ ඉගැන්වූ යාච්ඤාව වන්නේ,

1. නමෝ මරිය යාච්ඤාව
2. පරමණ්ඩල යාච්ඤාව
3. ත්‍රිත්ව ස්තෝත්‍රය
4. රාත්‍රී ආරාධනාව

17. ශුද්ධවන්තයන් අතරින් උසස්ම ගෞරවය හිමිවන්නේ,

1. ජුසේතුමාට ය.
2. ශුද්ධ වූ අන්තෝනි තුමාට ය.
3. ශුද්ධ වූ සෙබස්තියන් තුමාට ය.
4. මරිය තුමියට ය.

18. අපගේ විශ්වාසය ප්‍රකාශ කරමින් කරන යාච්ඤාව වන්නේ,

1. විශ්වාසකයින්ගේ යාච්ඤාව
2. විශ්වාස ලක්ෂණය
3. තුන්කාල ආරාධනාව
4. නමෝ මරිය යාච්ඤාව

19. පැරණි ගිවිසුමේ සඳහන් යාච්ඤා පොත වන්නේ,

1. ගීතාවලියයි.
2. හිතෝපදේශයයි.
3. උත්පත්ති පොතයි.
4. නික්මයාම පොතයි.

20. "මාගේ දෙවියනි, මම ඔබ වහන්සේට අනදර කළ නිසා බොහෝ සේ වික්ෂෝප වෙමි. මෙම වගන්තිය ඇතුලත් යාච්ඤාව වන්නේ,

1. නමෝ මරිය යාච්ඤාව
2. උදය ආරාධනාව
3. දයාධික මනස්ථාපනය
4. රාත්‍රී ආරාධනාව

## II කොටස

**පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.**

01. "යාච්ඤාව" ඇසුරින් ඔබ විසින් පන්ති කාමරය තුළ කළ ක්‍රියාකාරකම අනුව පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) යාච්ඤාව සම්බන්ධව ජේසුස් වහන්සේ වදාළ උපමා 2ක් නම් කරන්න. (ල. 2)

(2) කිතුනු අප යාච්ඤා කිරීමේ දී භාවිතා කරන ඉරියව් 2ක් ලියන්න. (ල. 2)

(3) ජේසුස් වහන්සේ යාච්ඤා කළ අවස්ථා 4ක් නම් කරන්න. (ල. 4)

(4) රාත්‍රී නින්දට පෙර කරන යාච්ඤාවට ඇතුළත් විය යුතු අදහස් 2ක් ලියන්න. (ල. 4)

(5) පොදු යැදුම් උච්චාරණය කිරීමේ දී සැලකිය යුතු කරුණු 2ක් ලියන්න. (ල. 4)

(ලකුණු 16)

02. (1) නව ගිවිසුමේ ශුභාරංචි 2ක් නම් කරන්න. (ල. 02)

(2) උත්පත්ති පොතේ ඇතුළත් කරුණු 3ක් ලියන්න. (ල. 03)

(3) ඔබ ශුද්ධ වූ බයිබලය ගෞරවයෙන් පරිහරණය කිරීම සඳහා කරනු ලබන දේවල් 3ක් ලියන්න. (ල. 06)

03. (1) දෙවියන් වහන්සේ ලෝකය මැවීමේ දී පළමු දින හා 6 වන දින මැවූ දේ මොනවා ද? (ල. 02)

(2) දේව මැවිල්ලෙන් මිනිසාට ඇති ප්‍රයෝජන 3ක් ලියන්න. (ල. 03)

(3) ජේසුස් වහන්සේගේ ළමා කාලයේ දී පෞරුෂ වර්ධනය වූ ආකාර 3ක් උදාහරණයක් සමග ලියා දක්වන්න. (ල. 06)

04. (1) දේව ප්‍රසාද නිධානයක ඇති ප්‍රධාන ලක්ෂණ 2ක් ලියන්න. (ල. 02)

(2) ආරම්භක දේව ප්‍රසාද නිධාන තුන නම් කරන්න. (ල. 03)

(3) ඔබව මෙලොවට බිහිකළ දෙමාපියන් වෙනුවෙන් කළ හැකි දේවල් 6ක් ලියන්න. (ල. 06)

05. (1) පළමු හා දෙවන දේව පනත් ලියා දක්වන්න. (ල. 02)

(2) පළමු දේව පනතට අනුව කළ යුතු දේවල් 3ක් ලියන්න. (ල. 03)

(3) දෙවි පියාණන් වහන්සේගේ කරුණාව හා ආශිර්වාදය ඔබේ ජීවිතයට ලබා ගැනීමට ඔබ ක්‍රියා කරන ආකාර 3ක් විස්තර කරන්න. (ල. 06)

06. (1) අසල්වැසියාට ප්‍රේම කළ යුතු බව දැක්වෙන දේව පනත් දෙකක් ලියන්න. (ල. 02)

(2) ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වූ ණය මංගල්‍ය 3ක් නම් කරන්න. (ල. 03)

(3) ජේසුස් වහන්සේව අනුගමනය කරන දරුවකු ලෙස ඔබට සතුරුකම් කරන අය වෙනුවෙන් කළ හැකි දේවල් 3ක් ලියන්න. (ල. 06)

07. (1) ස්වාමිවාක් ආරාධනාවේ ප්‍රශංසාත්මක පැතුම් 2ක් ලියන්න. (ල. 02)

(2) ස්වාමිවාක් ආරාධනාවට අනුව යාච්ඤාවක ඇතුළත් විය යුතු ප්‍රධාන ලක්ෂණ 3ක් ලියන්න. (ල 03)

(3) ඔබ අතින් සිදු වූ වැරදිවලට සමාව අයදිමින් යාච්ඤාවක් ලියන්න. (ල. 06)

■ ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති එක් එක් වාක්‍යයෙන් ප්‍රකාශිත අදහස හරි නම් (✔) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වාක්‍ය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

16. නිල්, කහ, රතු යනු වෙනත් වර්ණ මිශ්‍ර වීමකින් තොර වූ ස්වාධීන වර්ණයෝය. ( )

17. යම් වස්තුවක දිග පළල, ඝනත්වය දැක්වීම ත්‍රිමාන ලක්ෂණ දැක්වීම වේ. ( )

18. "නන්දි ගවයා" ශිව දෙවියන්ගේ වාහනය ලෙස සලකන්නේ ය. ( )

19. ශ්‍රී ලංකාවේ ධාතු ගර්භයක, හතරැස් කොටුව ලෙස හඳුන්වන කොටස ඉන්දීය සාංචි ස්ථූපයේ හර්මිකාව ලෙස හඳුන්වන්නේය. ( )

20. බෝල් පොයින්ට් පෑන ක්ෂණික රේඛා අධ්‍යයනයක් සඳහා වඩාත් යෝග්‍ය වන්නේ ය. ( )

(ලකුණු 2 X 20 = 40යි)

## II කොටස "අ"

■ පංති කාමරයේ දී අධ්‍යයනය කර ඇති ගෝලය, ඝනකය, ඝනකාභය, කේතුව ආදී වස්තූන්ගෙන් ඔබ කැමති වස්තුවක් ඇඳ එළිය අඳුර යොදා <u>ත්‍රිමාන ලක්ෂණ</u> මතුවන සේ පැන්සලෙන් වර්ණ කරන්න.

(ලකුණු 10යි)

## III කොටස "ආ"

■ පහත දී ඇති තේමාවලින් ඔබ කැමති <u>එක් තේමාවක්</u> තෝරාගෙන සිත්තම් කරන්න.

01. ඔබේ ආගමික සිද්ධස්ථානයේ ආගමික වතාවත්වල නිරතවන බැතිමතුන් ඇඳ වර්ණ කරන්න.
02. මිනිසුන්ට මෙන්ම සතුන්ට ද පොදු වූ "මව් සෙනෙහස" ඇඳ වර්ණ කරන්න.
03. සෙනඟ සිටින තේ කඩයක ඇතුළත ඇඳ වර්ණ කරන්න.
04. මල් සහ සමනල්ලු විධිමත් රටාවකට කඩදාසිය පුරා ඇඳ වර්ණ කරන්න.
05. උපන් දින තිළිණයක් දවටීම සඳහා සුදුසු වර්ණවත් දවටනයක් නිර්මාණය කරන්න.
06. "ශාක පත්‍ර" නමැති පොතට සුදුසු පිටකවරයක් නිර්මාණය කර වර්ණ කරන්න.
07. ක්‍රීඩා උත්සවයකට ආරාධනා කිරීම සඳහා සුදුසු ආරාධනා පත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

(ලකුණු 50යි)